# යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය නියෝජනය කළ ආචාර්ය දිඞ්නාගපාදයන් විසින් 'කල්පනා' යනුවෙන් අර්ථ දක්වා ඇත්තේ මුල් බුදුසමයේ පැහැදිලි කෙරෙන 'ප්‍රපංචකරණය ද?' (දාර්ශනික අධ්‍යයනයක්)

එස්. එම්. චතුරි ගවේෂිකා සමරකෝන්[1]

**හැඳින්වීම**

බුදුසමය විවිධ සම්ප්‍රදායන්ට බෙදීයාම ථෙරවාද හා මහායාන වශයෙන් සිදුවුණු සම්ප්‍රදාය ඛණ්ඩනය තුළින් වඩාත් තීව්‍ර වූවකි. මෙම පර්යේෂණය වූ කලී මහායාන සම්ප්‍රදායේ එන අනු සම්ප්‍රදායක් වන යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය නියෝජනය කළ දාර්ශනික හිමිනමක් වූ ආචාර්ය දිඞ්නාගපාදයන් විසින් ප්‍රත්‍යක්ෂය පිළිබඳ කතිකාවේ දී 'කල්පනා' යනුවෙන් අර්ථකථනය කොට ඇත්තේ මුල් බුදුසමයේ විග්‍රහ වන 'ප්‍රපංචකරණය' නමැති මානසික ක්‍රියාදාමය ද යන්න විමසා බැලෙන්නා වූ පර්යේෂණයකි.

**පර්යේෂණයේ අරමුණු**

මුල් බුදුසමයේ එන වැදගත් ම සංකල්පයක් වන ප්‍රපංචකරණය නමැති සංකල්පය අර්ථකථනය කිරීමේ දී මතුපිටින් ඒ හා සැසඳෙන අර්ථකථනයක් වන දිඞ්නාගපාදයන්ගේ කල්පනා නමැති සංකල්පය සැබෑ ලෙස ම ඒ හා සැසඳේ ද යන්න විමසා බැලීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා තුලනාත්මක අධ්‍යයනය, තාර්කික විශ්ලේෂණය හා අවස්ථානුකූලව අපෝහකවිධි ක්‍රමවේදයන් භාවිත වේ.

**පර්යේෂණ ගැටලුව**

ප්‍රත්‍යක්ෂය පිළිබඳ ව පැහැදිලි කිරීමේ දී ආචාර්ය දිඞ්නාගපපාදයන් විසින් භාවිත කරන ලද 'කල්පනා' යන යෙදුම මුල් බුදුසමයේ ප්‍රපංචකරණය හා සමගාමී වේ ද?

**පර්යේෂණ සාකච්ඡාව**

යෝගාචාර විඥානවාදී මහායාන ගුරුකුලයෙහි ප්‍රමුඛ පුද්ගලයෙකු සේ ගැනෙන ක්‍රි.ව.480 -540 අතර කාලය තුළ ජීවත් වූ බව සැලකෙන ආචාර්ය දිඞ්නාගපාදයන් වඩාත් ප්‍රකටව ඇත්තේ බෞද්ධ තර්කශාස්ත්‍රඥයෙකු ලෙස ය. උන්වහන්සේගේ ඥානවිභාගීය සාකච්ඡාවේ දී ප්‍රමාණ වශයෙන් පිළිගෙන ඇත්තේ ප්‍රත්‍යක්ෂය හා අනුමානය පමණි. ප්‍රත්‍යක්ෂය සම්බන්ධ විග්‍රහයේ දී ප්‍රත්‍යක්ෂයෙහි ස්වභාවය පිළිබඳ ව පැහැදිලි කරන දිඞ්නාගපාදයන් විසින් පැහැදිලි කරන ප්‍රධානතම ලක්ෂණය වන්නේ **'කල්පනා පෝඪ'** යන්න යි. මින් උන්වහන්සේ විසින් අදහස් කොට ඇත්තේ යදෘච්ඡ නාම, ජාති නාම, ගුණ ශබ්ද, ක්‍රියා

[1]. *chathush1221@gmail.com*

නාම හා ද්‍රව්‍ය නාම යනාදී වාචික සංඝටනයෙන් විමුක්ත වියයුතු බව යි. එය පසුකාලීන දර්ශන විචාරකයන් විසින් සඞ්කල්පීය සංස්කරණයෙන් විනිර්මුක්ත බව යනුවෙන් පැහැදිලි කෙරේ.

මින් යදෘච්ඡ නාම ලෙස හැඳින්වෙන්නේ විවිධ සංඥා නාමයන් ය. උදාහරණ වශයෙන් පුද්ගල නාම ගත හැකි ය. ජාති නාම යනු වර්ග නාමයන් ය. මිනිසා යනු එවැනි වර්ග නාමයකි. ගුණ නාම යනු කිසියම් ගුණයක් හැඳින්වීම උදෙසා යෙදෙන නාමයන් ය. හොඳ යනු එවැනි ගුණයකි. ක්‍රියා නාම යනු කිසියම් ක්‍රියාවක් හැඳින්වීමට යෙදෙන නාමයන් ය. 'පිසිනවා' යනු එවැනි ක්‍රියා නාමයකි. ද්‍රව්‍ය නාම යනු කිසියම් ද්‍රව්‍යයක් හැඳින්වීමට යෙදෙන නාමයන් ය. 'නලාකරු' යනු එවැනි ද්‍රව්‍ය නාමයකි. මෙකී පංචවිධ සඞ්කල්පීය සංඝටනයෙන් විමුක්තවීම දිඞ්නාගපාදයන් විසින් 'කල්පනා පෝඩ්' ලෙස හඳුන්වා ඇති බව පිළිගැනේ. මෙය වඩාත් පැහැදිලි කර දැක්වීම සඳහා දිඞ්නාගපාදයන් විසින් අභිධර්මපිටකයේ එන උදාහරණයක් ඉදිරිපත් කොට ඇත. එනම්, පුද්ගලයාගේ ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලිය තුළ නිල ප්‍රත්‍යක්ෂ කළ හැකි ය (**නීලං විජානාති**). එකී ප්‍රත්‍යක්ෂය 'නිල්' ආදී වශයෙන් ප්‍රකාශ නො කෙරෙයි. නමුත් එහි දී මෙය නිල් පැහැය වන බව (**නීලං ඉති විජානාති**) පැවසිය නො හැකි ය. මන්ද යත් එහි දී ගුණ නාමයක් ආරෝපණය වන බැවිනි. සඞ්කල්පීය සංස්කරණයක් එනම් නිල යන සඞ්කල්පය මේ හා සම්බන්ධව ඇති බැවින් එය දෝෂසහගත වන බව මෙහි සරල අදහස යි. එනම් හුදෙක් එය අව්‍යවහිත ප්‍රත්‍යක්ෂයක් ලෙස පමණක් ගත යුතු ය. එය තමා වටහා ගත්ත ද ප්‍රකාශ කළ නො හැකි ය.

සංස්කෘත භාෂාවෙන් 'කල්පනා' ලෙස හඳුන්වන ලද පදය 'විකල්ප' ලෙස ද බොහෝ අවස්ථාවල ඉදිරිපත්ව ඇත. සම්භාව්‍ය භාරතීය දාර්ශනිකයින් විසින් මෙම 'විකල්ප' යන පදය භාවිත කොට ඇත්තේ ඥානවිභාගීය පැහැදිලි කිරීම් සඳහා ය. බුදුසමයට අනුව ගත් කල මෙම සඞ්කල්පකරණය නැති නම් විකල්ප හඳුන්වනු ලබන්නේ 'ප්‍රපංචකරණය' යන පදයෙනි. මේ සම්බන්ධ විග්‍රහය තුළ බිමල් ක්‍රිෂ්ණ මතිලාල් පැහැදිලි කරන ආකාරයට බුදුසමයේ එන 'ප්‍රපංච' යන පදයත්, 'විකල්ප', 'කල්පනා' යන පද සමග සමගාමී වේ. ඔහු පැහැදිලි කරන ආකාරයට ප්‍රපංච යන පදයෙහි අර්ථය සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් 'verbal proliferation' යන යෙදුම යෝජනා කරයි. එහි අදහස වාචික ප්‍රගුණනය ලෙස සිංහල භාෂාවෙන් ගත හැකි ය. එමෙන් ම එය සඞ්කල්පීය ප්‍රගුණනය ලෙස ද ගත හැකි බව මතිලාල් යෝජනා කරයි.

හේයස් සඳහන් කරන ආකාරයට සරල ව ගත් කල කල්පනා යනු අදාළ දෙයෙහි ව්‍යූහය හඳුනා ගැනීම යි. ශාස්ත්‍රීය වශයෙන් ගත් කල කල්පනා යන්නට අර්ථ කිහිපයක් දිය හැකි ය. ඒ අතර කිසියම් පිළිවෙළකට අනුව සැකසීම, සකස් කිරීම, ව්‍යූහගත කිරීම, විධිමත් කිරීම වැනි අර්ථ ප්‍රමුඛ වේ. කල්පනාවන්ගෙන් තොර යනු හේයස් සඳහන් කරන ආකාරයට අර්ථකථනයන්ගෙන් තොර, ව්‍යූහය වටහා ගැනීමෙන් තොර වැනි අදහසකි. මේ සියලු ලක්ෂණ හේයස් සඳහන් කරන ආකාරයට භාෂාවෙන් තොර යන ලක්ෂණයට ඌනනය කළ හැකි ය.

සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ පැහැදිලි කරන ආකාරයට ප්‍රත්‍යක්ෂය කල්පනාවන්ගෙන් තොරයි යනුවෙන් අදහස් වන්නේ ශුද්ධ සංවේදනය පිළිබඳ අදහසකි. පුද්ගලයෙකු යමක් සංජානනය කරන සෑම අවස්ථාවක ම එය නවමු හා පුද්ගලයාට අනන්‍ය වූවක් ලෙස සංජානනය කරයි. නමුත් තමා දුටු දෙය පිළිබඳ ව

පැවසිය නො හැකි ය. එනම් එය අවාච්‍ය වේ. යම් අවස්ථාවක පුද්ගලයා විසින් තමා දුටු දෙය අයත් කුලකය, ගුණ, කාර්ය ආදිය පවසන්නේ නම් එය අනුමානය මිස ප්‍රත්‍යක්ෂය නො වේ.

'කල්පනා' යන පදය පිළිබඳ බටහිර දාර්ශනික අදහස් සැලකීමේ දී මතිලාල් පැහැදිලි කරන ආකාරයට එය ඉංග්‍රීසි භාෂාවෙන් 'Imagination' ලෙස ගත හැකි ය. මේ සම්බන්ධව නූතන යුගයේ දාර්ශනිකයන් දෙදෙනෙකු වූ ඉමැනුවෙල් කාන්ට් සහ ඩේවිඩ් හියුම් විසින් සිය කෘති තුළ මේ හා සමාන අර්ථයෙන් 'Imagination' යන පදය භාවිත කොට ඇත් බව මතිලාල් පැහැදිලි කරයි. ප්‍රත්‍යක්ෂය පිළිබඳ සම්භාව්‍ය සංස්කෘත දර්ශනයට අනුව නිර්විකල්පික ප්‍රත්‍යක්ෂය යනුවෙන් අදහස් වන්නේ 'Perception without imagination' එනම් පරිකල්පනයෙන් තොර ප්‍රත්‍යක්ෂය ලෙස මතිලාල් තර්ක කරයි. නමුත් 'පරිකල්පනයෙන් තොර' යන පදය තුළින් 'සංකල්පීය සංස්කරණයෙන් විමුක්ත' යන අදහස නියෝජනය වේ ද යන්න ගැටලුවකි. කෙසේ වෙතත් මෙම කල්පනා යන පදයෙන් භාෂාව හා සම්බන්ධ සංකල්පීයකරණයක් අදහස් වන බව ඤාණනන්ද හිමියන් පැහැදිලි කරයි. දාර්ශනික වශයෙන් කල්පනා කොට බැලීමේ දී කල්පනා යනුවෙන් අදහස් වන්නේ සංකල්පීය සංස්කරණය වුව ද එය ඍජුව භාෂාව හා සම්බන්ධ වන්නකි. වචනයක් යනු මතිලාල් පැහැදිලි කරන ආකාරයට කිසියම් දෙයක් හා සම්බන්ධව ගත් කල නිෂ්පාදනයෙහි දක්ෂ, මනඃකල්පිත හා සෙල්ලක්කාර (Inventive, Fanciful and Playful) සංකල්ප භාවිතයකි. මෙයින් පැහැදිලි වන්නේ සංකල්ප යනු සාමාන්‍ය භාෂාවේ මැදිහත් වීමෙන් නිෂ්පාදනය වන්නක් බව ය. එයින් එළඹිය හැකි නිගමනයක් වන්නේ දිඞ්නාගපාදයන් විසින් ප්‍රත්‍යක්ෂය සංකල්පීය සංස්කරණයෙන් විමුක්ත බව පැවසීම සරල ව විග්‍රහ කළහොත් එය භාෂාවෙන් විමුක්ත බවට ඌනනය කළ හැකි බව යි.

ප්‍රපංචකරණය පිළිබඳ ව විමසා බැලීමේ දී පාළි සූත්‍රපිටකයේ මජ්ඣිමනිකායේ මධුපිණ්ඩික සූත්‍රය තුළ මෙම කාරණය හා සම්බන්ධ අතිශය ගැඹුරු පැහැදිලි කිරීමක් දක්නට ලැබේ. **"ඇවැත්නි, ඇසත් රූපයනුත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. තුනෙහි එක්වයාම ස්පර්ශය යි. ස්පර්ශය ප්‍රත්‍යයෙන් වේදනාව වේ. යමක් විඳී ද එය හඳුනා ගනියි. යමක් හඳුනා ගනියි ද එය විතර්ක කරයි. යමක් විතර්ක කරයි ද, එය ප්‍රපඤ්ච කරයි. යමක් ප්‍රපඤ්ච කරයි ද ඒ හේතුකොටගෙන පපඤ්චසඤ්ඤාසංඛාවෝ අතීත අනාගත වර්තමාන ඇසින් දත යුතු රූප පිළිබඳ ව ඒ පුරුෂයා මැඩ පවත්වයි. ඇවැත්නි, කණත් ශබ්දයනුත් නිසා.... ඇවැත්නි, නැහැයත් ගඳසුවඳත් නිසා.... ඇවැත්නි, දිවත් රසයනුත් නිසා.... ඇවැත්නි, කයත් පැහැසිය යුතු දේත් නිසා..... ඇවැත්නි, මනසත් ධර්මාරම්මණයනුත් නිසා... මනසින් දතයුතු ධර්මාරම්මණයන් පිළිබඳ ව ඒ පුරුෂයා මැඩපවත්වයි."** මෙම විග්‍රහය පිළිබඳ ව කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන්ගේ පැහැදිලි කිරීම වන්නේ, 'ප්‍රපඤ්ච' යන පදයෙන් අවධාරණය වන්නේ ඉන්ද්‍රිය සංජානනයේ අවසන් අදියර වන බව යි. එය 'විතක්කයට' පසුව එන, ඉන්ද්‍රිය සංජානනයේ ඕළාරික සංකල්පමය අවස්ථාවක් ගම්‍ය වන බව උන්වහන්සේගේ අදහසයි. ඒ බව වඩාත් පැහැදිලි කිරීම සඳහා උන්වහන්සේ විසින් 'ප්‍රපඤ්ච' යන පදයෙහි නිරුක්ති ශාස්ත්‍රානුකූල අර්ථය කෙරෙහි ද අවධානය යොමු කොට ඇත.

ඤාණනන්ද හිමියන් පැහැදිලි කරන ආකාරයට 'ප්‍ර' යන ධාතුවෙහි අර්ථය 'පූර්ව' යන්න වේ. 'පඤ්ච්' ධාතුවෙන් ගම්‍ය වන්නේ විස්තාරය, විහිදී යාම, පැතිරී යාම, විවිධත්වයට පත්වීම වැනි අදහස් ය. ඒ අනුව

'ප්‍රපඤ්ච' යන්නෙහි මූලික අර්ථය උන්වහන්සේ පැහැදිලි කරන පරිදි සංකල්ප තුළ ඇති අතු ඉති විහිදී යාම යි. මෙම අතු ඉති විහිදී යාම කෙතරම් ප්‍රබල ද යත්, උන්වහන්සේ එය පැහැදිලි කර ඇත්තේ, " **අනෙක් අතට 'ප්‍රපඤ්ච' යන පදය වඩා පුළුල් අරුතක් දනවමින් පුහුදුන් පුගුලාගේ කාල්පනික 'කුළුමීමා' ගාල කඩාගෙන දිව යන හැටි ඉඟි කරයි."** යනුවෙනි. අනෙක් අතට 'පපඤ්චසඤ්ඤාසංඛා' යන පදය සඳහා ඤාණනන්ද හිමියන් විසින් ඉදිරිපත් කරන අර්ථය වන්නේ 'මනසෙහි ඇති සංකල්පයන්ගේ ලියලන ප්‍රවණතාව තුළින් ජනිත ගිණීම්, පැණවීම් හෝ සම්මුති' යනාදිය යි. මෙම පැහැදිලි කිරීම් තුළින් ගම්‍ය වන්නේ පුද්ගලයා ඉන්ද්‍රිය සංජානනය තුළින් ලෝකය සම්බන්ධව ගනු ලබන තොරතුරු මනස මඟින් සංස්කරණයකට ලක් කරන බව යි. ප්‍රපංච යනුවෙන් අදහස් වන්නේ එය යි. මෙකී ප්‍රපංච බාහිර ලෝකය හා අනුරූප ඒවා නො ව පුද්ගලයා ප්‍රපංචකරණයේ නො වැළැක්විය හැකි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ඒවා ය. මෙමඟින් පුද්ගලයා යටපත් වන අතර, නිර්වාණයෙන් පුද්ගලයා මෑත් කොට තබන්නේ ද මෙකී සංකල්ප යි.

මේ අනුව පැහැදිලි වන්නේ දිඞ්නාගපාදයන් විසින් කල්පනා යනුවෙන් පැහැදිලි කරන ලද්දේ හුදෙක් සංවේදනය භාෂා භාවිතයෙන් ප්‍රකාශ කිරීමක් වන අතර, මුල් බුදුසමයේ එන ප්‍රපංචකරණය සංවේදන සංජානන හා ප්‍රජානන ක්‍රියාවලියේ අතිශය සංකීර්ණ හා ව්‍යාකූල බව අඟවනසුලු ගැඹුරු මානසික ක්‍රියාදාමයක් වන බව යි.

**පර්යේෂණ නිගමනය**

මතුපිටින් සලකා බැලීමේ දී ආචාර්ය දිඞ්නාගපාදයන් විසින් 'කල්පනා' යනුවෙන් අර්ථ දක්වා ඇත්තේ මුල් බුදුසමයේ පැහැදිලි කෙරෙන 'ප්‍රපංචකරණය' සේ පෙනී ගිය ද මේ අතර සැලකිය යුතු විෂමතා විද්‍යමාන වේ. දිඞ්නාගපාදයන්ගේ අර්ථකථනය හුදෙක් භාෂාව, ඥානය හා අදාළ වුව ද මුල් බුදුසමයේ විග්‍රහ වන ප්‍රපංචකරණය අතිශය ගැඹුරු මානසික ක්‍රියාදාමයක් විග්‍රහ කිරීමක් සඳහා යොදන ලද පදයකි.

**ප්‍රමුඛ පදඃ** යෝගාචාර, දිඞ්නාගපාද, කල්පනා, ප්‍රත්‍යක්ෂය, ප්‍රපංචකරණය,

මූලාශ්‍රය


- මජ්ඣිමනිකාය. **මධුපිණ්ඩික සූත්‍රය.**
- භික්ඛු ඤාණනන්ද, කටුකුරුන්දේ. (2016). **පැරණි බෞද්ධ චින්තාවේ සංකල්පය හා යථාර්ථය,** බෞද්ධ ප්‍රකාශන සංගමය.
- Dignaga. (1968). **Dignaga on Perception;** Being the Pratyakṣapariccheda of Dignaga's Pramānasamuccaya from the Sanskrit and the Tibetan Version. Masaaki Hattori (tr.). Harvard University Press.
- Hayes, Richard P. (1945). **Dignaga on the Interpretation of Signs Studies of Classical India 9**. Hollend: Kluwer Academic Publishers.
- Matilal, Bimal Krishna (1986). **Perception and Essay on Classical Indian Theories of Knowledge.** Oxford: Clarendon Press.
- Vidyabhusana, Satis Chandra (1920). **A History of Indian Logic;** Ancient, Medieval and Modern Schools. New Delhi: Motilal Banarsidass Publishers Private Limited.